055283
ML/PR
2017/09/08

# සොකරි නාටකයේ ප්‍රාසංගික ලක්ෂණ

055283

# හැඳින්වීම

සිංහල ගැමි ජන සමාජය තුළ බිහි වූ ජන නාටක කලාව ජන සාහිත්‍යයේ හා පොදු ජන සංස්කෘතියේ වැදගත් ස්ථානයක් හිමිකර ගන්නා විෂය ක්ෂේත්‍රයකි. ශ්‍රී ලාංකේය ජන සංස්කෘතිය තුළ ඊට ම අනන්‍ය වූ ස්වරූපයක් අනුව ප්‍රචලිත සොකරි ජන නාටකය හුදී ජනයාගේ කලාත්මක මනස පෝෂණය කිරීමටත්, සමාජයේ අඩුලුහුඬුතා හා ආකල්ප වෙනස් කිරීමටත් සමත් ව සමාජමය වශයෙන් හා පුද්ගලානුබද්ධ ව පැවතුණි. කලා නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ දී ඒ තුළ විචිත්‍රත්වයෙන් යුතුව ප්‍රේක්ෂක අවධානය යොමු කර ගැනීම ප්‍රාසංගිකත්වය ලෙස හඳුන්වයි. ගැමි සංස්කෘතියේ නිර්මාණය වන සොකරි නාටකය තුළ ප්‍රාසංගිකත්වය අන්තර්ගත වී පවතී ද යන්න මෙම නිබන්ධිකාවෙන් අධ්‍යයනය කෙරේ.

මෙම නිබන්ධිකාවේ ප්‍රථම පරිච්ඡේදයෙහි සොකරි නාටකයේ පසුබිම හා ස්වභාවය පිළිබඳව තොරතුරු ගෙනහැර දක්වා ඇත. ප්‍රථමයෙන් ම සොකරි නාටකයේ පසුබිම සාකච්ඡා වේ. දෙවනුව සොකරි කතා පුවත පිළිබඳව විවිධ ජනප්‍රවාද කතා පුවත් කීපයක් ඇසුරින් පෙන්වා දී ඇත. අනතුරුව සොකරි නාටකය දේශීය සංස්කෘතිය තුළ ව්‍යාප්ත වී ඇති ආකාරයත් එය ප්‍රචලිතව පවතින ප්‍රදේශ පිළිබඳව ත් විග්‍රහ වේ. සොකරි නාටකයක අනන්‍ය වූ රංග භූමිය ලෙස කමත හා ඊට අමතර ස්ථාන යොදාගැනීම පිළිබඳව ද මෙහි දී විග්‍රහ වේ.

දෙවෙනි පරිච්ඡේදය සොකරි නාටකයෙන් හෙළිවන සමාජ සහ සංස්කෘතික කරුණු සාකච්ඡා කෙරෙන්නකි. එහිදී පළමුව සොකරි නාටකයේ සමාජ අපේක්ෂා විමර්ශනය කෙරෙයි. ඉන් අනතුරුව සොකරි නාටකයෙන් අර්ථ ගැන්වෙන සමාජ සංස්කෘතික පසුබිම පිළිබඳ අධ්‍යයනයක යෙදී ඇත. එම පරිච්ඡේදයේ අවසන් භාගයේ දී සොකරි නාටකයේ ආගමික සංකල්ප හා පූජා විධි පිළිබඳ සංකල්ප හා පූජා විධි පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාවක් ඇතුළත් ය.

ප්‍රාසංගික කලාව යනු කුමක්දැයි තෙවන පරිච්ඡේදයෙන් අධ්‍යයනය කර ඇත. එහි ප්‍රාසංගික යන වචනාර්ථය පිළිබඳ අර්ථ විග්‍රහයක් හා ඒ පිළිබඳ විද්වතුන්ගේ මත